ශීර්ෂය - 202 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සහ ප්‍රමාණාත්මක ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අග්‍රිම ශේෂය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ, අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් දරන ලද වියදම රු.2,353,661ක් වුවද 1,879,401ක් වශයෙන් රු. 474,260 ක් අඩුවෙන් සහ අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද බැර කිරීම් රු.1,152,115 ක් වුවද රු.1,626,375 ක් වශයෙන් රු.474,260 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.	අයිතම හඳුනා ගැනීමේදී වැරදීමක් සිදු වූ බවත්, එය නිවැරදි කිරීමට අදාල කටයුතු සිදු කරන බවත් දන්වා තිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ii)	අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද හර කිරීම් රු.285,215 ක් වුවද රු.500,215 ක් වශයෙන් රු.215,000 ක් වැඩියෙන් සහ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් අත්තිකාරම් බී ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් රු.215,000 ක් වුවද එවැනි බැරකම් නොමැති ලෙස රු.215,000 ක් අඩුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.	අයිතම හඳුනා ගැනීමේදී වැරදීමක් සිදු වූ බවත්, එය නිවැරදි කිරීමට අදාල කටයුතු සිදු කරන බවත් දන්වා තිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**බැරකම් පිළිබඳ ලේඛනය**		
	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	විධිමත් අයුරින් යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස විෂය නිලධාරි දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.

(ii)	**වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි.	වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගෙන යන ලෙස විෂය නිලධාරි දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයන් 09ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.20,750,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.9,578,821ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 29 සිට සියයට 84 දක්වා පරාසයක් ගෙන තිබුණි.	2024 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ දේශීය ගමන් වියදම් 2025 වර්ෂයේ ගෙවීම, සැලසුම් කර තිබූ වැඩසටහන් බොහොමයක් කල් දැමීමට සිදුවීම, දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට අදාළ ඇස්තමේන්තුව හා ප්‍රතිපාදන සීමාව තුල මිලගණන් නොලැබීම හා අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කාලය ප්‍රමාණවත් නොවීම, ආරක්ෂක සේවා වියදම්වලින් සියයට 50 ක් හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් හා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කිරීම සහ ණය ලබාගත් නිලධාරීන් ස්ථාන මාරුවීම් ලැබීම මත වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි.	මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට නිවැරදිවත් සම්පූර්ණවත් සිදු කල යුතු වීම.
(ආ)	මූලධන වැය විෂයයන් 03ක් සඳහා ප්‍රතිපාදිත එකතුව, රු.2,300,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,227,696ක් ඉතිරි වී තිබූ අතර	පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ සහ වාහන පුනරුත්ථාපනය හෝ වැඩිදියුණු කිරීමක අවශ්‍යතාවය ඇති නොවීම	මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට නිවැරදිවත් සම්පූර්ණවත්

	එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 33 සිට සියයට 79 දක්වා පරාසයක් ගෙන තිබුණි.	හා කාර්ය මණ්ඩල පුහුණු සැසි වලට අදාල ගෙවීම් ජනවාරි මාසය තුල ද පියවා ඇති බැවින් ප්‍රතිපාදන ඉතිරියක් පෙන්නුම් කරන බව දන්වා තිබුණි.	සිදු කල යුතු වීම.
(ඇ)	පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.2,000,000ක් සහ මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.600,000ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.	හජ් වන්දනා රාජකාරි කටයුතු සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරීන් සඳහා වූ විදේශ ගමන් වියදම් පදනම් කරගත් අතර රජයට වැය බරක් නොවන අයුරෙන් අදාල විදේශ ගමන් වියදම් හජ් අරමුදලෙන් ගෙවීම, දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමට අදාළ ඇස්තමේන්තුව හා ප්‍රතිපාදන සීමාව තුල මිලගණන් නොලැබීම හා අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කාලය ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රතිපාදනය ඉතිරි වූ බව දන්වා තිබුණි.	හැකිතාක් නිවැරදිවත් සම්පූර්ණවත් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම.
(ඈ)	පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා මූලික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන්කරගෙන නොතිබියදී පරිපූරක හා මුදල් රෙගුලාසි 66/69 මඟින් වර්ෂය තුල රු.55,919,536ක් මාරු කරගෙන තිබූ අතර වර්ෂය අවසානයේදී සමස්ත ප්‍රතිපාදනයම ඉතිරිව පැවතුණි.	2025 වර්ෂය සඳහා වූ රටඉදි 2024 දෙසැම්බර් මස අගභාගයේ දීම රේගුවට ලැබීම හා එය නිශ්කාෂණයට අදාල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පරිපූරක හා මුදල් රෙගුලාසි 66/69 මගින් ප්‍රතිපාදන මාරු කලද නිශ්කාෂණ කටයුතු සිදු කිරීමට අපහසු වූ බැවින් හා අදාල ගෙවීම් 2025 වර්ෂයේ සිදුකිරීමට, ITMIS පද්ධතියට අදාල ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු නැවුම්ව සක්‍රිය කිරීමෙන් පසුව කලයුතු වූ බැවින් 2024 වර්ෂයේ ලද උක්ත සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරි වී පැවතුන බව දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා පමණක් මුදල් රෙගුලාසි 66/69 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර ගත යුතු වීම.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මු.රෙ 94(2) හා (3) ප්‍රකාරව, වටිනාකම රු. 1,149,441ක් වූ බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම්වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශය (ඇමුණුම iv) යටතේ ඇතුළත් කළ යුතු වුවත් බැදීම් පිළිබඳ තොරතුරු අදාළ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.	අදාල බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම්වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශය (ඇමුණුම iv) යටතේ ඇතුළත් කර නොතිබුණේ වැරදීමකින් බවත් එය නිවැරදි කිරීමට අදාලව නිලධාරියා දැනුවත් කර ඇති බවත් දන්වා තිබුණි.	අදාළ මාර්ගෝපදේශ ප්‍රකාරව එළඹෙන බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.

(ආ)	මු.රෙ. 94(1) හා 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 ජේදයේ (ඇ) වගන්තිය අනුව දෙසැම්බර් 31 දිනට ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා බැදීම් හා බැරකම් වලට එළඹිය නොහැකි වුවද, වැය විෂයය අංක 202-2-1-0-1403 (විදුලිය හා ජලය) සඳහා ඉතිරි ප්‍රතිපාදන වටිනාකම වූ රු.205,318 ඉක්මවා රු.254,792 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.	අදාළ ඉතිරි ප්‍රතිපාදන වටිනාකම රු.205,318 ක් වූ බැවින් බැදීම් ලෙස ITMIS හා සිගාස් වෙබ් යෙදුම් දෙක හරහාම බැදීම් ලෙස සලකනු ලැබුවේ රු.74,172.65 ක වටිනාකමින් යුතු ජනවාරි මාසයේ ලද දෙසැම්බර් මාසයට අදාල ජල බිල්පත පමණක් බව කාරුණිකව දන්වන අතර බැරකම් ලේඛණයේ වවුචර් අංක 2501-14 යටතේ රු.385,937.64 ක වටිනාකමින් යුතු විදුලි බිල්පත වැරදීමකින් සටහන් වී ඇති බව දන්වමි. එම වරද නිවැරදි කිරීමට අදාලව නිලධාරියා දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	බැදීම් හා බැරකම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	කාලයක සිට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක, ගණකාධිකාරී, සහකාර අධ්‍යක්ෂ වැනි තනතුරු 6ක් පුරප්පාඩුව පැවැති බැවින් මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ගැනීමට නොහැකි වී තිබුණි. මේ වනවිට මෙම තනතුරු වලින් කිහිපයක් සම්පූර්ණ කර විධිමත් මූල්‍ය හා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. ඉදිරියේදී සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කලට අවශ්‍ය අදාළ සමාලෝචනයන් සිදුකිරීමටත්, මේ සම්බන්ධයෙන් විගණකාධිපති ලිඛිතව දැනුවත් කිරීමටත් කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතින බැවින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුල සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදීමට නොහැකි වී තිබේ. නමුත් මේ වනවිට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේද සහය ඇතිව අභ්‍යන්තර විගණන කර්තව්‍ය විධිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමටත් නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමටත් ඒ අනුව සියළුම විගණන විමසුම්වලට නිශ්චිත කාලසීමාවන් තුල පිළිතුරු ලබා දීමටත් ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ඇ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	අභ්‍යන්තර විගණක තනතුර අනුමත වූ දින සිට පුරප්පාඩුව පවතින බැවින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට, නොහැකි වී ඇති බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(i)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ**				
	• XII පරිච්ඡේදයේ 22.3 උප වගන්තිය	-	වැටුප් රහිත නිවාඩු කාලය අතරට වැටෙන සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින වැටුප් රහිත නිවාඩු ලෙස සැලකිය	පසුගිය කාලවල වැටුප් රහිත නිවාඩු කාලය අතරට වැටෙන සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින වැටුප් රහිත නිවාඩු ලෙස	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ

			යුතු වුවද නිලධාරීන් 14 දෙනෙකුගේ වැටුප් රහිත නිවාඩු ගණනයේදී එම දින සැලකිල්ලට ගෙන නොතිබුණි.	සලකා කටයුතු කර ඇති අතර නිවාඩු විෂය නිලධාරිනිය විෂයට ආධුනික බැවින් වැරදීමකින් යම් මාසයන් සඳහා මෙම අත්හැරීම සිදු වී ඇති අතර එය නිවැරදි කිරීමට අදාල කඩිනම් පියවර ගනු ලබන බව දන්වා තිබුණි.	යුතු වීම
(ii)	**2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් ප්‍රකාශිත මුදල් රෙගුලාසි**				
	• **756(6)**	-	පෙර වසරේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ පිටපතක් ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව මාස 13 ක් ප්‍රමාද වී 2025 අප්‍රේල් 29 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.	2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව 2025 අප්‍රේල් 29 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර පිටපත් අමාත්‍යාංශ ලේකම්, අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, අභ්‍යන්තර විගණක වෙත ද යොමු කර ඇති බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාල සීමාවන් තුලදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම
	• **770 (4) ඡේදය**	-	2021 හා 2022 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මඟින් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස පොදු 47 ආකෘතිය යටතේ ඉදිරිපත් කර තිබූ අයිතම 155ක් වෙන්දේසි කිරීම හෝ සුදුසු පරිදි කටයුතු කිරීම සිදු කර නොතිබුණි.	2021 හා 2022 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ අගය කිරීම සඳහා තක්සේරු කමිටුවක් 2023.07.20 දින පත් කර ඇත. මේ සම්බන්ධයෙන් වන ඉදිරි කටයුතු යථා කාලයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම

	• **876 (3)**	දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මගින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර චක්‍රලේඛ ප්‍රකාරව අරමුදල පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සලකා බලා නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මගින් නීත්‍යානුකූලව පිහිටුවීමට අදාල මූලික කටයුතු මේ වනවිටත් අවසන් වී ඇති අතර මේ සම්බන්ධයෙන් වන අවසන් වාර්තාව හජ් කමිටු සභාපති විසින් ජූනි මාසයේ ගරු අමාත්‍යතුමා වෙත භාරදීමට නියමිත බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(iii)	**2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 02/2018 දරන රාජ්‍ය අංශය තුල මානව සම්පත් සංවර්ධනය කිරීමේ චක්‍රලේඛය** -	දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවද. සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට අදාළව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කරන ලෙසට අදාල නිලධාරියා දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(iv)	**2017 ජුනි 28 වැනි දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක 01/2017 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛය** -	ආයතන විසින් මිලදී ගන්නා සහ අපහරණය කරන ලද වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ආයතනය විසින් මිලදී ගන්නා සහ අපහරණය කරන ලද වත්කම් සම්බන්ධයෙන් තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත කඩිනමින් ඉදිරිපත් කරන ලෙසට නිලධාරියා දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	අදාළ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා රු.1,000,000ක් ප්‍රතිපාදනය කර තිබුණද අදාළ අළුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රතිපාදන සීමාව තුල මිලගණන් නොලැබීම හා අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කාලය ප්‍රමාණවත් නොවූ බැවින් සැලසුම් කල ගොඩනැගිලි අළුත්වැඩියාව 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිත බව දන්වා තිබුණි.	සැලසුම් ප්‍රකාරව කටයුතු ඉටු කළ යුතු වීම.

(ආ)	මුස්ලිම් කලා හා සංස්කෘතික කටයුතු පොහොසත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණක් ලෙස හඳුනාගෙන තිබූ අතර එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු කාර්යයක් වශයෙන් මුස්ලිම් කලාව හා සංස්කෘතිය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම දක්වා තිබුණද, ඊට අදාළව ව්‍යාපෘතින් කවරේද යන්න පිළිබඳව හඳුනා ගෙන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	හඳුනාගෙන ඇති අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතුය.
(ඇ)	මුස්ලිම් කාන්තාවන් සහ තරුණයින් බලගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණක් වුවද, සමාලෝචිත වර්ෂයේදී එම අරමුණ ඉටුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් හඳුනා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	හඳුනාගෙන ඇති අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතුය.

4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2025 ජනවාරි 10 දින මාස 6 ක ප්‍රමාදයක් සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.	ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමුකර කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	2024 අංක 44 දරන රජ්‍ය මුදලා කළමනාකරන පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ආ)	කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව කඩිනමින් විගණනයට ඉදිරිපත් කරන ලෙස නිලධාරියා දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	රාජ්‍ය ගිණුම් මාරගෝපදේශ අංක 14 පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කල යුතුය.

4.3 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පර්චස් 80 ක් වූ ඉඩමෙහි දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ල අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත 2017 වර්ෂයේදී ඉදි කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩමේ නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	ඉඩමේ නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අදාළ කටයුතු කඩිනමින් කළ යුතු වීම.

4.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2025 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

	විගණන විමසුම පිළිබඳ විස්තරය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාහන භාවිතය පරීක්ෂා කිරීම - 2024 (CAA/C/DMR/2024/AQ/01 - 2024.11.26)	2024.05.09 දිනැති විගණන විමසුම සඳහා 2024 මැයි 29 දින පිළිතුරු ලබා දී ඇති බවත් 2024 දෙසැම්බර් 16 දිනැති විගණන විමසුම සඳහා කඩිනමින් පිළිතුරු ලබා දෙන	අදාළ කාලසීමාව තුලදී විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම - 2024 (CAA/C/DMR/2024/AQ/02 - 2024.12.16)		

(ඇ)	මූල්‍ය හා කාර්ය සාධන විගණනය - 2024 (CAA/C/DMR/2024/AQ/05 - 2025.05.02)	ලෙසත් නිලධාරියා දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38(i)(ඊ) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වේ. තවද, මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී සහ වගකීම් ඉටුකිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු වේ. එසේ වුවද, දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගෙන නොතිබූ අතර 2015 වර්ෂයේ ඇති කර තිබූ අභ්‍යන්තර විගණක තනතුර මෙම වාර්තාවේ දිනය වන විටත් පුරප්පාඩු වී පැවතුණි.	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතින බැවින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති නමුත් මේ වනවිට අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණකගේද සහාය ඇතිව අභ්‍යන්තර විගණන කර්තව්‍ය විධිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තියේ විධිවිධාන පරිදි සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතින නමුත් මේ වනවිට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේද සහය ඇතිව අභ්‍යන්තර විගණන කර්තව්‍ය විධිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමටත් නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමටත් අවශ්‍ය කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 123ක් වුවද. තත්‍ය කාර්ය මණ්ඩලය 107ක් වූ අතර ඒ තුළ සංවර්ධන නිලධාරීන් 26 දෙනෙකුගේ අතිරික්තයක් සහ සෙසු නිලධාරීන් 42 කගේ පුරප්පාඩු පැවතුණි.	2021 සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමේදී පුරප්පාඩු නොසලකා අනුයුක්ත කර ඇති බැවින් සංවර්ධන නිලධාරීන් අතිරික්තයක් පවතී. දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කර දෙන මෙන් කිහිප වතාවක් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. ඉන් සමහර පුරප්පාඩු දැනට සම්පූර්ණ කල නොහැකි බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුම් දී ඇති බව දන්වා තිබුණි.	අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගැනීමට හෝ අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතුය.